*සැ. යු.* - 2020.01.24 වැනි දින පළ වූ අංක 2160 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,161 - 2020 ජනවාරි මස 31 වැනි සිකුරාදා - 2020.01.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅා) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 178 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 179 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | — |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 187 |

*සැ. යු.* - *වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 ජනවාරි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** *වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.*

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 පෙබරවාරි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 පෙබරවාරි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2020***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2020.03.13 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගන්නා ස්ථානය* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| උතුරු මැද පළාත | අනුරාධපුර | පදවිය | පළාත් සර්වේයර් ජනරාල් (උතුරු මැද පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, අනුරාධපුර. | පදවිය අවට | 2020.05.01 සිට වසර 02ක් සඳහා |
| නැගෙනහිර පළාත | මඩකලපුව | කලුවන්චිකුඩි | පළාත් සර්වේයර් ජනරාල් (නැගෙනහිර පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ත්‍රිකුණාමලය. | කලවන්චිකුඩි අවට | 2020.04.01 සිට වසර 02ක් සඳහා |

*සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :*

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතු ය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය. අවම වශයෙන් වාහන තුනක් නවතා තැබීමට පහසුකම් හා ගරාජ පහසුකම් තිබිය යුතු ය. මායිම් ගල් සකස් කිරීම සඳහා ඉඩපහසුකම් තිබිය යුතු අතර, නිළධාරීන් දහදෙනෙකුට ප්‍රමාණවත් කාමර පහසුකම් ද තිබිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, **සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද**, සහිතව, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදාළ ස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2020.03.13 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

එස්. එම්. පී. පී. සංගක්කාර,
සර්වේයර් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

*ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2020*

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2020**

*ගොඩනැගිලි අයිතිකරුගේ -*

1. සම්පූර්ණ නම : ____________.
2. ලිපිනය : ____________.
3. දුරකථන අංකය : ____________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : ____________.

*ගොඩනැගිල්ල -*

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : ____________.
2. මාසික කුලී මුදල : ____________.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : ____________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : ____________.
5. භූමියේ විශාලත්වය : ____________.
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර: ____________.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : ____________.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : ____________.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/...........................) : ____________.
10. නවතා තැබීමට හැකි වාහන ගණන : ____________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් ම විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

____________.
අයදුම්කරුගේ අත්සන.

01-784

# බඩු බාහිරාදිය විකිණීම්

**ප්‍රසිද්ධ භාණ්ඩ වෙන්දේසිය**

මහෙස්ත්‍රාත් අධිකරණය - නුගේගොඩ

මෙම අධිකරණයේ රාජසන්තක කරන ලදුව හා මෙතෙක් හිමිකම් නොකියන ලදුව වෙන්දේසි කිරීමට නියම කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2020.02.15 සෙනසුරාදා දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. අධිකරණ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය මත එදින පෙ. ව. 9.00 සිට පෙ. ව. 10.00 දක්වා උපලේඛනයේ සඳහන් භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය.

03. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළිගනු නොලැබුවහොත් අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරගැනීමේ අභිමතය අධිකරණය සතු වේ.

04. මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම ගෙවීම් කර භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් වලංගු මුදලින් පමණක් කළ යුතු ය.

05. උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් ඉදිරිපත් කරන තැනැත්තකු සිටී නම්, වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් තහවුරු කළ යුතු ය.

06. සියලුම ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු වේ.

ඒ. එම්. ඒ. වසන්ත කුමාර,
මහෙස්ත්‍රාත්.

2020 ජනවාරි මස 20 වැනි දින,
නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ අංකය | භාණ්ඩ විස්තරය | වෙන්දේසි වටිනාකම |
|---|---|---|---|---|
| 01. | 28028 | | ජල කරාම 01 | |
| 02. | 27526 | | දුරකථන චාජර් 01 | |
| 03. | 27695 | | ටේප් 01 | |
| 04. | 27869 | | ටේප් 01 | |
| 05. | 27522 | | ෆෝටබල් ෂොකට් අවුට්ලට් 03 | |
| 06. | 27503 | | මල්ටි ෂොකට් 02 | |
| 07. | 27504 | | ඇම්පියර් 13 පවර් ඇඩැප්ටර් 03 | |
| 08. | 27608 | | විදුලි පන්දමක් | |
| 09. | 27194 | | ජංගම දුරකථන චාජර් 01 | |
| 10. | ඒ. ආර්. 49/19 | | පැනසොනික් අඟල් 32 එල්. ඊ. ඩී. රූපවාහිනී යන්ත්‍රය | |
| 11. | ඒ. ආර්. 50/19 | | ඩෙල් වර්ගයේ ලැප්ටොප් 01 | |
| 12. | ඒ. ආර්. 51/19 | | ෆිලිප්ස් වර්ගයේ සී. ඩී. ප්ලේයර් 01 | |
| 13. | ඒ. ආර්. 52/19 | | සොෆ්ට් ලොජික් ලැප්ටොප් 01 | |
| 14. | ඒ. ආර්. 53/19 | | ක්‍යු වර්ගයේ ලැප්ටොප් 01 | |
| 15. | ඒ. ආර්. 54/19 | | ටොෂිබා වර්ගයේ ලැප්ටොප් 01 | |
| 16. | ඒ. ආර්. 55/19 | | එම්. එස්. අයි. වර්ගයේ ලැප්ටොප් 01 | |
| 17. | ඒ. ආර්. 56/19 | | එච්. පී. වර්ගයේ ලැප්ටොප් 01 | |
| 18. | ඒ. ආර්. 57/19 | | ඩෙල් වර්ගයේ ලැප්ටොප් 01 | |
| 19. | ඒ. ආර්. 58/19 | | ටොෂිබා වර්ගයේ ලැප්ටොප් 01 | |
| 20. | ඒ. ආර්. 83/19 | | එච්. පී. වර්ගයේ ලැප්ටොප් 01 | |
| 21. | ඒ. ආර්. 84/19 | | කම්පැක් වර්ගයේ ලැප්ටොප් 01 | |
| | | | එච්. පී. වර්ගයේ ලැප්ටොප් 01 | |
| 22. | ඒ. ආර්. 85/19 | | කොණ්ඩෙ කපන මැෂින් 01 | |
| 23. | ඒ. ආර්. 361/18 | | ටොෂිබා අයි. 3 ලැප්ටොප් 01 | |
| 24. | ඒ. ආර්. 364/18 | | ජංගම දුරකතන 01 | |
| 25. | ඒ. ආර්. 365/18 | | ස්ටාර් වර්ගයේ ජංගම දුරකතන 01 | |
| | | | නොකියා වර්ගයේ ජංගම දුරකතන 01 | |
| | | | සැම්සුන් ජංගම දුරකතන 01 | |
| | | | ටැබ් 01 | |
| 26. | ඒ. ආර්. 312/18 | | ලැප්ටොප් 05 | |

01-786

---

## කැකිරාව මහෙස්ත්‍රාත් අධිකරණය

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කැකිරාව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් කිසිවකු හිමිකම් නොකියන ලද පහත සඳහන් ද්‍රව්‍ය 2020.02.29 වැනි දින පෙරවරු 9.30 ට මෙම අධිකරණ භූමියේදී විකුණනු ලැබේ.

මෙහි සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ කිසිවකු අයිතිවාසිකම් දක්වන්නේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන් හි දී, අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන ද්‍රව්‍යයක් එවලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලු ගෙවීම් මුදලින් කළ යුතුවන අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන ගැණුම්කරුවන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
කැකිරාව.

2020 ජනවාරි මස 17 වැනි දින,
කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**ප්‍රසිද්ධ වෙන්දේසිය**

**දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණය - කැකිරාව 2020.02.29**

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. | 21928 | | NC-RE- 5154 මහ ට්‍රැක්ටරය | 1 |
| 2. | 4305 | | GT - 7287 ලොරි රථය | 1 |
| 3. | 26249 | | NW - JI - 9680 කාර් රථය | 1 |
| 4. | AR 988/18 | | NW - JM - 4138 යතුරු පැදිය | 1 |
| 5. | AR 1030/18 | | CP - TD. 3363 යතුරු පැදිය | 1 |
| 6. | AR 1091/18 | | NC - UK 3845 යතුරු පැදිය | 1 |
| 7. | AR 1092/18 | | NW - TZ 5387 යතුරු පැදිය | 1 |
| 8. | 33197 (B. 661/18) | | WP - HJ - 0339 යතුරු පැදිය | 1 |
| 9. | 38906 (B. 68/19) | | NC - BBT - 9799 යතුරු පැදිය | 1 |
| 10. | 46337 | | බාල්දි | 1 |
| 11. | 46157 | | සවල් | 1 |
| 12. | 33199 (B.663/18) | | වාහන බැටරි | 1 |
| 13. | 33196 (B.660/18) | | වාහන බැටරි | 1 |
| 14. | 33203 (B.591/18) | | වාහන බැටරි | 1 |
| 15. | 42265 (B.621/19) | (i) | අලවංගු | 1 |
| | | (ii) | උදලු | 1 |
| | | (iii) | දුම්මල කබල | 1 |
| | | (iv) | කතුරු | 1 |
| 16. | 44663(B.1090/19) | (i) | වතුර මෝටරය | 1 |
| | | (ii) | අඩි 76 දිග වයර් | 1 |
| | | (iii) | කොළ පාට පුට්වැල් | 1 |
| | | (iv) | අඩි 25ක් දිග වයර් | 1 |
| | | (v) | ගල් කටු | 1 |
| | | (vi) | කුළු ගෙඩි | 1 |
| | | (vii) | හෝල්ඩරය | 1 |
| 17. | 44308 | (i) | තරාදි | 1 |
| | | (ii) | 1 Kg බර පඩි | 1 |
| 18. | 43914 | (i) | සවල් | 1 |
| | | (ii) | බාල්දි | 1 |
| 19. | 44409 | | බාල්දි | 1 |
| 20. | 44607 | | පොරව | 1 |
| 21. | 44170 | (i) | නියන් | 1 |
| | | (ii) | අතකොලු | 1 |
| 22. | 44735 | (i) | සවල් | 1 |
| | | (ii) | බාල්දි | 1 |
| 23. | 44736 | | සවල් | 2 |
| 24. | 44737 | | සවල් | 1 |
| 25. | 41761 | (i) | අලවංගු | 1 |
| | | (ii) | කටුව | 2 |
| | | (iii) | කුළු ගෙඩි | 1 |
| | | (iv) | ප්ලාස්ටික් තාච්චි | 1 |
| 26. | 44785 | | බාල්දිය | 1 |
| 27. | 45056 | | කළුපාට ටෙන්ට් රෙදි | 1 |
| 28. | 45014 | | නාම පුවරු සැකිලි (ඇලුමිනියම් ) | 1 |
| 29. | AR/1652/18 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු | 1 |
| 30. | AR/1654/18 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු | 1 |
| 31. | AR/1655/18 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු | 1 |
| 32. | 26997 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු | 1 |
| 33. | 41766 | | කැත්ත | 1 |
| 34. | 26283 | | ගෑස් සිලින්ඩර් | 1 |
| 35. | 27027 | | ගෑස් සිලින්ඩර් | 1 |
| 36. | 45355 | | 2 L ද්‍රව මිණුම | 1 |
| 37. | 43858 | | ද්‍රව මිණුම | 1 |
| 38. | 33199 (B. 663/18) | | වාහන බැටරි | 1 |
| 39. | 33201 (B.589/18) | | වාහන බැටරි | 1 |
| 40. | 33203 (B.591/18) | | වාහන බැටරි | 1 |
| 41. | 33204 (B.633/18) | | වාහන බැටරි | 1 |
| 42. | 33196 (B.660/18) | | වාහන බැටරි | 1 |
| 43. | 33195 (B.659/18) | | වාහන බැටරි | 1 |
| 44. | 45367 | | ලණුව සහිත බකට් | 1 |
| 45. | 40167 | (i) | අලවංගු | 1 |
| | | (ii) | කුළු ගෙඩි | 1 |
| | | (iii) | හිල්ටි කටු | 2 |
| | | (iv) | වයර් | 1 |
| | | (v) | බට කෑබලි | 1 |
| | | (vi) | වතුර මෝටරය | 1 |
| | | (vii) | අත් වැසුම් ජෝඩු | 3 |
| | | (viii) | ප්ලාස්ටික් බේසම | 1 |
| 46. | 43911 | | ප්ලාස්ටික් කලය | 1 |
| 47. | 43548 | | මැටි කලය | 1 |
| 48. | 42408 | | ඇලුමිනියම් භාජනය | 1 |
| 49. | 40707 | | ඇලුමිනියම් මුට්ටි | 1 |
| 50. | 39507 | | දුනු තරාදිය | 1 |
| 51. | 40167 | | තැටි තරාදිය | 1 |
| 52. | 39506 | | තරාදිය | 1 |
| 53. | 39508 | | ඉලෙක්ට්‍රොනික් තරාදි | 1 |
| 54. | 43861 | | ඉලෙක්ට්‍රොනික් තරාදි | 1 |
| 55. | 43860 | | ඉලෙක්ට්‍රොනික් තරාදි | 1 |
| 56. | 30818 | | ඉලෙක්ට්‍රොනික් තරාදි | 1 |
| 57. | 41833 | | සින්තා පැදුරු | 1 |
| 58. | 40780 | | සින්තා පැදුරු | 1 |
| 59. | 43299 | | සින්තා පැදුරු | 2 |
| 60. | අංක රහිත | | සින්තා රතුපාට පැදුරු | 1 |
| 61. | 42547 | | වේවැල් කුඩ | 1 |
| 62. | 42546 | | වේවැල් කුඩ | 1 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 63. | 43979 (PR. 901/19) | සවල් | 1 |
| 64. | 43451 | සවල් | 1 |
| 65. | 43780 | සවල් | 1 |
| 66. | 43684 | සවල් | 1 |
| 67. | 42791 | සවල් | 1 |
| 68. | 42766 | සවල් | 1 |
| 69. | 42846 | සවල් | 1 |
| 70. | 42779 | සවල් | 1 |
| 71. | 41238 | සවල් | 1 |
| 72. | 40660 | සවල් | 1 |
| 73. | 40022 | සවල් | 1 |
| 74. | 40023 | සවල් | 1 |
| 75. | 38379 | සවල් | 1 |
| 76. | PR/53/19 | සවල් | 1 |
| 77. | PR/638/19 | සවල් | 1 |
| 78. | PR/944/19 | සවල් | 1 |
| 79. | PR/676/19 | සවල් | 1 |
| 80. | PR/1020/19 | සවල් | 1 |
| 81. | 38108 | කැත්ත | 1 |
| 82. | 23141 | කැත්ත | 1 |
| 83. | 16541 | කැත්ත | 1 |
| 84. | 16544 | කැත්ත | 1 |
| 85. | 25469 | කැත්ත | 2 |
| 86. | 15970 | කැත්ත | 1 |
| 87. | 23139 | කැත්ත | 1 |
| 88. | 16545 | කැත්ත | 1 |
| 89. | 35437 | කැත්ත | 1 |
| 90. | 38354 | කැත්ත | 1 |
| 91. | 16782 | උදළු | 1 |
| 92. | 23458 | උදළු | 1 |
| 93. | 42765 | උදළු | 1 |
| 94. | 98625 | උදළු | 1 |
| 95. | 37376 | උදළු | 1 |
| 96. | 35435 | උදළු | 1 |
| 97. | 42765 | අලවංගුව | 1 |
| 98. | 24976 | බාල්දිය | 1 |
| 99. | 26733 | බාල්දිය | 1 |
| 100. | 42766 | බාල්දිය | 1 |
| 101. | 42765 | බාල්දිය | 2 |
| 102. | 42791 | බාල්දිය | 1 |
| 103. | 34479 | බාල්දිය | 1 |
| 104. | 41238 | බාල්දිය | 1 |
| 105. | 40661 | බාල්දිය | 1 |
| 106. | 42993 | බාල්දිය | 1 |
| 107. | 42992 | බාල්දිය | 1 |
| 108. | 42165 | බාල්දිය | 1 |
| 109. | 42846 | බාල්දිය | 1 |
| 110. | 42627 ( PR. 1048/19) | බාල්දිය | 2 |
| 111. | 41653/( PR. 840/19) | බාල්දිය | 1 |
| 112. | අංක රහිත | බාල්දිය | 2 |
| 113. | 28992 | පොරව | 1 |
| 114. | 33403 | මිණුම් පටිය | 1 |
| 115. | 38557 | ගෑස් සිලින්ඩරය | 1 |
| 116. | 41478 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප | 1 |
| 117. | අංක රහිත | රෙගියුලේටරය සහිත ගෑස් ලිප | 1 |
| 118. | 45468 | සින්තා පැදුරු | 1 |
| 119. | 20203(B.290/15) | සෙවිලි තහඩු | 6 |
| 120. | 28674 | පාපැදි | 4 |
| 121. | 15075 ( B.844/15) | 1. අඩි 173 ක් දිග අඟල් 02 ඇල්කටීන් බටය | 1 |
| | | 2. අඩි 27ක් දිග අඟල් 02 කලු පාට ඇල්කටීන් | 1 |
| 122. | 26489 | LIDA වර්ගයේ බහුකාර්ය වඩු මැෂිම | 1 |
| 123. | 41210 ( B.306/19) | 1. ගෑස් සිලින්ඩර | 1 |
| | | 2. රෙගියුලේටරය සහිත ගෑස් ලිප | 1 |
| 124. | 39443 | ගෑස් සිලින්ඩර | 1 |
| | | ගෑස් ලිප | 1 |
| 125. | 35598 | ගෑස් සිලින්ඩර | 1 |
| | | ගෑස් ලිප | 1 |
| | | සුදු හා රතු පාට පොම්ප | 1 |
| 126. | 45271 | සවල් | 1 |
| | | බාල්දි | 1 |
| 127. | 36882 | ගෑස් සිලින්ඩර | 1 |
| | | ගෑස් ලිප | 1 |
| 128. | 45538 | ඇළුමිණියම් කලගෙඩිය | 1 |
| 129. | 44849 | සවල් | 1 |
| 130. | 44413 | සවල් | 1 |
| | | බාල්දි | 1 |
| 131. | 41645 | 1. 05 Kg ගෑස් සිලින්ඩරය | 1 |
| | | 2. ගෑස් ලිප | 1 |
| 132. | 45673 | 1. සවල් | 1 |
| | | 2. බාල්දි | 2 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 133. | 45792 | 1. සවල් | 1 |
| | | 2. බාල්දි | 1 |
| 134. | 35234 | 1. ලී අතකොලු | 1 |
| | | 2. නියන් | 1 |
| 135. | 45923 | සවල් | 1 |
| 136. | 46158 | සවල් | 1 |
| 137. | 46160 | සවල් | 1 |
| 138. | 46159 | බාල්දිය | 1 |
| 139. | 44408 | සවල් | 1 |
| 140. | 44410 | සවල් | 1 |
| | | බාල්දි | 1 |
| 141. | 46156 | වේවැල් කුඩ | 1 |
| 142. | 40662 | රතු කහ මිශ්‍ර වූල් බෙඩ්ෂීට් | 1 |
| 143. | 46330 | උදලු | 1 |
| 144. | 46328 | උදලු | 1 |
| 145. | 46329 | සවල් | 1 |
| | | උදලු | 1 |
| 146. | 46336 | බාල්දි | 1 |
| 147. | අංක රහිත | වීදුරු බෝතල් තොගයක් | - |
| 148. | අංක රහිත | උළු කැට තොගයක් | - |
| 149. | අංක රහිත | බොරළු කියුබ් | 10 |
| 150. | අංක රහිත | බූලි තොගයක් | - |

01-785

---

**සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - මනම්පිටිය**

පස් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළව රාජසන්තක කරන ලද පස් කියුබ් 10ක් 2020.02.07 වැනි දින පෙ. ව. 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසියේ මිළ දී ගනු ලබන පස් සඳහා මුදල් ගෙවීමේ දී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් පමණක් ගෙවීම් සිදුකළ යුතු අතර, චෙක්පත් බැංකු අණකර කිසිවක් භාර ගනු නොලැබේ.

03. භාණ්ඩ මිලදී ගැනීමේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

04. වෙන්දේසියෙන් මිළ දී ගන්නා ලද පස් වෙන්දේසිය පවත්වන දිනයේ දී ප. ව. 5.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම්, වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

හර්ෂණ ධනුෂ්ක රත්නායක,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
පොළොන්නරුව.

2020 ජනවාරි මස 16 වැනි දින,
පොළොන්නරුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | අධිකරණය | පස් කියුබ් ප්‍රමාණය |
|---|---|---|
| 01. | මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය | 10 |

01-793

## මහෙස්ත්‍රාත් අධිකරණය - තංගල්ල

අධිකරණයට ඉදිරිපත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. තංගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2020.02.13 වැනි දින ප. ව. 1.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ. මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු සිටී නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය. වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

03. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිලිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇනවුම භාර ගනු නොලැබේ.

05. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

එල්. ටී. වරුසවිතාන,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,
තංගල්ල.

2020 ජනවාරි මස 09 වැනි දින,
තංගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | 10672 | වාහන හයිඩ්‍රොලික් ජැක් | 01 |
| 02. | 39882 | ප්ලාස්ටික් පැදුරු | 01 |
| 03. | 17539 | අබලන් පා පැදිය | 01 |
| 04. | BR 358/09 | අබලන් පා පැදිය | 01 |
| 05. | 2164 | චේවැල් කුඩ | 02 |
| 06. | BR 03/07 | 1. යකඩ බාල්දිය | 01 |
| | | 2. ප්ලාස්ටික් එල්බෝ | 01 |
| 07. | 10806 | 1. අලවංගු | 01 |
| | | 2. මන්නා පිහිය | 01 |
| 08. | 10083 | පොරව | 01 |
| 09. | 37142 | 1. මන්නා පිහි | 02 |
| | | 2. කිලෝ 10 තැටි තරාදි | 01 |
| 10. | 29125<br>29126<br>29127<br>29128 | ප්ලාස්ටික් බාල්දි | 04 |
| 11. | 39666 | ප්ලාස්ටික් පැදුරු | 01 |
| 12. | 8862 | 1. පොල් උල | 01 |
| | | 2. කම්බි කූර | 01 |
| 13. | 11774 | අබලන් රූපවාහිනී යන්ත්‍ර | 01 |
| 14. | 79925 | අබලන් පා පැදි | 01 |
| | | සෙරෙප්පු ජෝඩු | 01 |
| | | මන්නා පිහි | 01 |
| | | අලවංගු | 01 |
| 15. | AR 539/19 | ප්ලාස්ටික් තාච්චි | 01 |
| | | ඇද ලී කැබලි | 01 |
| | | ජංගම දුරකතන | 01 |
| | | යකඩ බට කැබලි | 01 |
| 16. | AR 545/19 | 1. ජංගම දුරකථන | 01 |
| | | 2. අබලන් ලැප්ටොප් යන්ත්‍ර | 01 |
| | | 3. කැත්ත | 01 |
| | | 4. විවිධ දිග ප්‍රමාණයෙන් යුත් බයින්ඩින් කම්බි රෝල් | 04 |
| | | 5. විවිධ දිග ප්‍රමාණයෙන් යුත් තඹ කැබලි | - |
| 17. | AR 564/19 | 1. මන්නා පිහි | 01 |
| | | 2. මසුන් මැරීමට යොදා ගන්නා ලද උපකරණ | 01 |
| 18. | AR 96/17 | අබලන් පා පැදි | 01 |
| 19. | අංක රහිත | වීදුරු බෝතල් තොගය | - |
| 20. | 28742 | 1. ගෑස් සිලින්ඩර් | 02 |
| | | 2. ගෑස් ලිප් | 02 |
| 21. | 12883 | අබලන් ඩිජිටල් කැමරා | 01 |
| 22. | 39399 | ලියාපදිංචි අංක රහිත අබලන් සී පැන් වර්ගයේ අත් ට්‍රැක්ටර් එන්ජින් කොටස (කැබලිවලට) | |
| 23. | 37672 | ලියාපදිංචි අංක රහිත අබලන් සී පැන් වර්ගයේ අත් ට්‍රැක්ටරය ටේලරය සහිත (කැබලිවලට) | |
| 24. | 33184 | අංක එස්පීඩීජ්බී 9760 දරන ෆෝටොන් වර්ගයේ බට්ටා ලොරි රථය | |

01-798

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව වන දැන්වීමයි.

සමාගමේ නාමය : ග්‍රීන් එනර්ජි මෝටර්-සෝලාර් (පී වී ටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 00218141
ලියාපදිංචි කාර්යාලය : ගුරුකන්දවත්ත, බටකැටිය, මජුවාන, කෙරදෙවාල.

01-684

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : කලූ කොස්මෙටික්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 129979
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 15ඒ, ප්‍රතිහිම්බාරාම පාර, කලුබෝවිල, දෙහිවල
ලියාපදිංචි දිනය : 2018.02.20

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

01-722

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ද එලිෆන්ට් ස්ටේබල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 81586
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 32/2, සුහද මාවත, පිටකෝට්ටේ රජමහා විහාර පාර, පිටකෝට්ටේ
ලියාපදිංචි දිනය : 2011.09.29

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

01-723

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(2) වගන්තිය යටතේ නාගොඩවිතාන එන්ටටේන්මන්ට් ඇන්ඩ් ඇඩ්වටයිසිං සමාගමේ නාමය හරේන් නාගොඩවිතාන ගෲප් ඔෆ් කම්පැනිස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් 2019.12.18 වැනි දින වෙනස්කර ලියාපදිංචි කරන ලදී.

පෙර නම : නාගොඩවිතාන එන්ටටේන්මන්ට් ඇන්ඩ් ඇඩ්වටයිසිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 109360
ලියාපදිංචි ලිපිනය : A 1/8 පෙරහැර මාවත, කොළඹ 3
සංස්ථාගත කළ දිනය : 2015.10.23
සමාගමේ නව නාමය : හරේන් නාගොඩවිතාන ගෲප් ඔෆ් කම්පැනිස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ආර්. කේ. ජයවීර මිය,
සමාගම් ලේකම්.

01-739

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කර ඇති බව දැනුම් දීම.

සමාගමේ නම : ස්පයිස් මීඩියා (පුද්.) සමාගම
ලියාපදිංචි කාර්යාලය : අංක 24 ඒ, බුලර්ස් පටුමග, කොළඹ 07
සංස්ථාගත දිනය : 2020 ජනවාරි 7
ලියාපදිංචි අංකය : පීවී 00219202,

එෆ්. එස්. සාලි,
සමාගම් ලේකම්.

19/5, සුලෙයිමාන් ටෙරස්,
කොළඹ 05.

01-743

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

මහරගම, ගොඩිගමුව, තාප්පවත්ත පාර, අංක 25ඒ/42 හි පදිංචි සම්මු ආරච්චිගේ නිලානි කීර්තිකා එදිරිසිංහ (ජා. හැ. අංක 748100660 V) වන මම මාගේ ඇටර්නි බලකරු ලෙස නුගේගොඩ, පාගොඩ පාර, අංක 25/20 ඒ හි පදිංචි රාජපක්ෂ මුදියන්සේලාගේ නිල්මිණි අනුරුද්ධිකා කරුණාරත්න (ජා. හැ. අංක 647572251 V) යන අයව පත් කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රසන්න

පල්ලේවෙල විසින් වර්ෂ 2012 නොවැම්බර් මස 11 වැනි දින ලියා සහතික කරන ලද අංක 812 දරන විශේෂ ඇටොර්නි බලපත්‍රය මෙයින් අවලංගු හා බලරහිත කරන බව ශ්‍රී ලංකා ජනරජය වෙත හා මහජනතාව වෙත ද මෙයින් දනුම් දෙමි. තවද, එකී ඇටර්නි බලපත්‍රය ප්‍රකාරව මින් ඉදිරියට එකී ඇටර්නි බලකරු විසින් සිදුකරන කිසිම ගණුදෙනුවකට මාගේ බැදීමක් හෝ වගකීමක් නොමැති බව ද දන්වමි.

සම්මු ආරච්චිගේ නිලානි කීර්තිකා එදිරිසිංහ.

01-771

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

හෝමාගම ගොඩගම අක්ෂිදාන මාවත, අංක 163 හි පදිංචි චන්දිමා මල්රුක්ෂි අල්විස් ජයසිංහ (ජා. හැ. අ. 745411703 V) යන අයට හෝමාගම, ගොඩගම, බොරැල්ල පාර, අංක 192/3 හි පදිංචි නිරෝෂා දිල්රුක්ෂි අල්විස් ජයසිංහ (ජා. හැ. අ. 756491997 V) යන මා විසින් ලබා දී ඇති ප්‍රසිද්ධ නොතාරිස් කේ. චමනි නිරංජිකා අබේරත්න යන අය විසින් අංක 5471 යටතේ 2019.10.14 දින සහතික කරන ලද දෙල්කඳ නුගේගොඩ, සහකාර රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 4921 දිනපොත් අංක යටතේ 56 පිටුවේ 245 පොතේ 2019.10.29 වැනි දින ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනයාට දනුම් දෙමි. මින් පසු මැය විසින් කරනු ලබන ක්‍රියාකාරකම් කිසිවකටත් මා වග නොකියන බව ද මා දන්වමි.

නිරෝෂා දිල්රුක්ෂි අල්විස් ජයසිංහ.

01-772

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : අලංකාර් කැෂ්මීර් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00210156
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 154/ඒ, හයිලෙවල් පාර, මහරගම
ලියාපදිංචි දිනය : 2019.03.23

සමාගමේ නම : ඔන්වින් හෝල්ඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00211736
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 234/4, ෆ්ලොරිඩා උද්‍යානය, ජයශ්‍රීගම, රාගම
ලියාපදිංචි දිනය : 2019.05.14

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

01-776

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 05, හැව්ලොක් පාර, අංක 220/4 හි පදිංචි සුරේෂ් කුමාර් පේරින්පනායගම් (ජා. හැ. අ. 732580042 V) වන මම ප්‍රසිද්ධ නොතාරිස් ග්‍රේෂන් ඊ පෙරේරා යන අය විසින් 2006.07.31 වැනි දින ඇටෝර්නි බලපත්‍ර අංක 2267 හි සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මත මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කොළඹ 05, හැව්ලොක් පාර, අංක 220/4 හි පදිංචි නාගලිංගම් පේරින්පනායගම් යන අයව පත්කර ඇත. එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රය අද දින අවලංගු කරන බව මහජනතාවට මෙයින් දන්වමි.

සුරේෂ් කුමාර් පේරින්පනායගම්.

2019 නොවැම්බර් මස 27 වැනි දින.

01-791

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. - මහනුවර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉතා වටිනා දේපළක් මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහනුවර මහ නගර සභා සීමාවන් තුළ අරුප්පල බටහිර 223 ග්‍රාම නිලධාරි වසමේ බූවැලිකඩ තල්වත්ත ගමේ ධර්මාශෝක මාවතේ වරිපනම් අංක 102 දරන ''ෆොන්සේකා වත්ත'' නමැති ඉඩමට බලයලත් මානක ඒ. එම්. තිලකරත්න විසින් 2015.01.19 වැනි දින සාදන ලද අංක 1361 ඒ දරන පිඹුරේ නිරූපිත ලොට් 02 සහ ලොට් 03 නමැති බෙදා වෙන් කළ ඒකාබද්ධ ඉඩම් කොටස් දෙක හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : රූඩ් 03, පර්චස් 20

මෙම දේපළ දොන් පියතිස්ස කුමාරගේ සහ දොන් තුෂාන් ඉන්දික කුමාරගේ යන අය ණයකරුවන් වශයෙන් හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - මහනුවර නගර මධ්‍යයේ සිට අනගාරික ධර්මපාල මාවතේ ගමන් ගෙන ලේලවැල්ල පාරට (ජෙනරාල් පාරමී කුලතුංග මාවත) පිවිස එම පාරේ කි. මී. 2.5ක් පමණ 1/7 බෝක්කුව දක්වා පැමිණ වමට හැරී ධර්මාශෝක මාවතට පිවිස එම පාරේ මීටර් 700ක් පමණ වාගොල්ල සුසාන භූමිය දක්වා පැමිණි විට පාරේ දකුණු පසින් පාරට මායිම්ව අදාළ දේපළ පිහිටා තිබේ.

2020 ක් වූ පෙබරවාරි මස 19 වැනි දින ප.ව. 3.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති සඳහා 2018.07.06 වැනි දින රජයේ *ගැසට්* පත්‍රය ද, 2018.07.17 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකුරල් පුවත්පත් ද බලන්න.

ගෙවීමේ ක්‍රමය : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමණාකරු (වාණිජ අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 - 2661835, 011- 2661836, 011- 2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

01-751

---

## හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. - ගල්ගමුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ හෙල්ගොඩ එගොඩ කෝරළේ හිරියාල හත්පත්තුවේ, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ තඹගල්ල අංක 445 ග්‍රාම නිලධාරි වසම තඹගල්ල හි පිහිටි ''පහළමූකලාන සහ ඕතුයාය'' නමැති ඉඩමට බලයලත් මානක ඒ. එස්. කේ. පරණගේ විසින් 2014.12.25 වැනි දින සාදන ලද අංක 2014/150 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 නමැති බෙද වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය අක්කර 01, රූඩ් 02, පර්චස් 23.5

මෙම දේපළ J S ට්‍රේඩින් යන නාමය විලාසය සහ අභිධානය යටතේ තනි අයිතිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සේනානායක අමරසිංහ මොහොට්ටි අප්පුහාමිලාගේ ජයවංස යන අය බන්ධනදායි වශයෙන් හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - කුරුණෑගල සිට දඹුල්ල මාර්ගයේ කි. මී. 2 පමණ මුත්තෙට්ටුගල හන්දිය දක්වා ගමන් ගෙන වමට පිහිටි හිරිපිටිය පාරට හැරී එම පාරේ කි. මී. 18.4 ක් පමණ ගමන් කර හිරිපිටිය හරස් පාර හන්දියෙන් වමට හැරී වාරියපොල පාරට පිවිස එම පාරේ කි. මී. 2.3ක් පමණ ගමන් කර ගනේවත්ත දක්වා පැමිණ දකුණට හැරී කැකුලාවල පාරේ කි. මී. 05ක් පමණ ගිය පසු අදළ දේපළ මෙම මාර්ගයේ වම් පසින් තඹගල්ල හන්දියේ පිහිටා තිබේ.

2020 ක් වූ පෙබරවාරි මස 19 වැනි දින පෙ. ව. 10.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති සඳහා 2019.04.18 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2019.05.06 වැනි දින මව්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමණාකරු ( අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
දුරකථන අංක : 011 - 2661835, 011- 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

01-752

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කොඩිකාමම් ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යාපනය දිස්ත්‍රික්කයේ චාවකච්චේරි සුළුනගර සභා සීමාවන් හි වෝඩ් අංක 18 (ජේ 319) මීසාලේයි බටහිර ග්‍රාම නිලධාරි වසම තුළ මීසාලේයි ගමේ කාලිකෝවිල් පාරේ පිහිටි ''පැන්ට්‍රික්කර්නි'' නැමති ඉඩමට බලයලත් මානක එස්. සර්වේස්වරන් විසින් 2014.06.07 වැනි දින සාදන ලද අංක 14128 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් 01 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : 01 එල්එම්එස් වීසී සහ 17 කුලිස්

මෙම දේපළ අගාෂ් ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - චාවකච්චේරි නගරයේ සිට ඒ 9 පාරේ කි. මී. 03ක් පමණ මීසාලේයි බටහිර දක්වා ගමන් ගෙන වමට හැරී කාලිකෝවිල් පාරට පිවිස එම පාරේ මීටර් 200ක් පමණ ගමන් ගත් පසු මෙම පාරේ දකුණු පසින් කාලිකෝවිල් පාරට මුහුණ ලා අදාළ දේපළ පිහිටා තිබේ.

2020 ක් වූ පෙබරවාරි මස 20 වැනි දින ප. ව. 1.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති සඳහා 2018.01.19 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2018.01.25 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 750,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමණාකරු (වාණිජ අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 - 2661835, 011- 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

01-753

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මඩකලපුව ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ නිවේදනය

හැටන් නැෂනල් බැන්ක් පී එල් සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව, උක්වත්ත ආරච්චිලාගේ ප්‍රසන්ජිත් ලනිල් ජයවර්ධන යන අය බන්ධනදායි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කරන ලද දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*1 වන විකිණීම.* - 2020 ක් වූ පෙබරවාරි මස 24 වැනි දින පෙ.ව. 9.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී

*දේපළ විස්තරය .-* කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ උඩකනුගල අංක 102 සී ග්‍රාම නිලධාරි කොට්ඨාසය උඩකනුගල ගමේ පිහිටි ''කැකුණ අතුල හේන්යාය හෙවත් සඳමාලි වත්ත'' නමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. ආර්. ජේ. විජේසේකර විසින් 2015.04.26 වැනි දින සාදන ලද අංක 612 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් 01 සහ ලොට් 02 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය ලොට් 01 - අ. 06, රූ. 01, පර්. 27.15 ලොට් 02 අ. 09, රූ. 03, පර්. 39.44 (මුළු ප්‍රමාණය : අ. 16, රූ. 01, පර්. 26.59)

බලයලත් මානක ඩී. ඒ. විජේසිංහ විසින් සාදන ලද 2000.12.29 වැනි දින අංක 2409 ඒ සහ 2001.08.29 වැනි දින අංක ඩී/3065 දරන පිඹුරේ දක්වා ඇති වෙන් කරන ලද මාර්ග මතින් මාර්ග අයිතිය සහ අනෙකුත් අයිතීන් ද සමග වේ.

*දේපළට පිවිසීම.* - කොළඹ නගරයේ සිට හයිලෙවල් පාර ඔස්සේ අවිස්සාවේල්ල හන්දිය දක්වා පැමිණ වමට පිහිටි හැටන් පාරට හැරී මීටර් 600ක් පමණ ගමන් කර වමට හැරී මීටර් 850ක් පමණ තල්දූව හන්දිය දක්වා පැමිණ කටුනායක පාරට (නිට්ටඹුව පාර) හැරී එම පාරේ කි. මී. 1.125 ක් පමණ (කි. මී. 09 කණුව පසු කර මීටර් 100ක් පමණ ) අම්තිරිගල හන්දියට පැමිණ වමට හැරී මීටර් 75ක් පමණ ගමන් ගෙන හිසෙල්ල පාරේ ඉදිරියට මීටර් 750ක් පමණ ගමන් ගෙන වමට හැරී කුඩුම්බිකන්ද පාරට පිවිස එම පාරේ දිගට ම මීටර් 750ක් පමණ පැමිණි විට අදාළ දේපල මෙම මාර්ගයේ දෙපසින් පිහිටා තිබේ.

*2 වන විකිණීම.* - 2020 ක් වූ පෙබරවාරි මස 24 වැනි දින ප. ව. 1.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මොරටුව නගර සභා සීමාවන් තුළ 548 කල්දෙමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය අංක 138 දරන ඊබට් පටුමග කල්දෙමුල්ලහි පිහිටි ''අලුබෝදන්ගහකුරුදුවත්ත'' නමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. ඒ. නොබට් ප්‍රනාන්දු විසින් 2006.11.15 වැනි දින සාදන ලද අංක 3667 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් 02 බී දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 8.85

සහ එකී අංක 3667 දරන පිඹුරේ ලොට් 2 සී (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කරන ලද) මතින් මාර්ග අයිතිය සහ අනෙකුත් අයිතිවාසිකම් ද සමග වේ.

*දේපළට පිවිසීම.* - කොළඹ නගරයේ සිට ගාලු පාර ඔස්සේ මොරටුව දෙසට කි. මී. 15ක් පමණ රත්මලාන ගොලුමඩම හන්දිය පසුකර මීටර් 100ක් පමණ පැමිණ දකුණට හැරී ඊබට් පටුමගට පිවිස එම පටුමගේ මීටර් 800ක් පමණ පැමිණි විට අදළ දේපළ මෙම මාර්ගයේ දකුණු පසින් පිහිටා තිබේ. (වරිපනම් අංක 138 ඊබට් පටුමග)

යෝජනා සම්මුති සඳහා 2019.03.22 වැනි දින රජයේ *ගැසට්* පත්‍රය ද, 2019.03.27 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,

3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමණාකරු (වාණිජ අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
දුරකථන අංක : 011 - 2661835, 011- 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/071-8446374/071-4962449.

01-756

---

HNB 331 - 19

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ග්‍රීන්පාත් ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2016 නොවැම්බර් මස 24 වැනි දින සහතික කළ අංක 5471 දරන බැදුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම සරත් මහින්ද කුමාර මැදගෙදර යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2020ක් වූ පෙබරවාරි මස 18 වැනි දින පෙරවරු 9.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ අධිකාරිපත්තුවේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ රාජසිංහගම 502 සී ග්‍රාම නිලධාරී වසම තුළ මුල්ලේරියාවේ පිහිටි සහ තලංගම පටුමග වරිපනම් අංක 20/116 දරන ගොඩපොරගහලන්ද දූන් හල්බරාව එස්ටේට් යනුවෙන් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එම්. ඒ. එච්. බණ්ඩාර විසින් 2012 අප්‍රේල් මස 30 වැනි දින පිළියෙල කරන ලද අංක 4104 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 101 වශයෙන් දක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහයක (අ. 0 රූ. 0 පර්. 10) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

ඉහත කී අංක 4104 දරන පිඹුරේ දක්වෙන ලොට් අංක ආර් 11, ආර්. 7, ආර්. 15, ආර්. 19, ආර්. 10 සහ ආර් 1 දරන මාර්ග සඳහා වෙන් කිරීම් සහ අනෙකුත් සියලුම මාර්ග සඳහා වෙන් කිරීම් සහ කානු සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.07.05 දින රජයේ *ගැසට් පත්‍රය* හා 2019.07.22 දින මව්බිම, තිනකුරල් සහ ඩේලිමිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - මෙම දේපළට ළඟාවීමට මාලඹේ නගරයේ සිට කඩුවෙල පාරේ කි. මී. 3ක් පමණ දුරක් ගොස් චන්ද්‍රිකා කුමාරතුංග මාවතට වමට හැරී ඔබේ වම් අත පැත්තේ ඇති බුදු පිළිමය හමුවන තෙක්. කි. මී. 2.7 ගමන් කර වමට හැරී ''නිවාසි'' නිවාස යෝජනා ක්‍රමය දක්වා ගොස් එම නිවාස සංකීර්ණයේ ගේට්ටුව දක්වා මීටර් 400ක් ගොස් එතැනින් එම සංකීර්ණයේ ඇති අභ්‍යන්තර පාරට ඇතුල් වී මීටර් 70ක් පමණ ගමන් කළ විට දකුණු අත පැත්තේ ඇති එවැනි දේපළ රොත්තක් මැද එම පාරට යාබදව ඇති මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් දහයක් (රු. 1,000)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු : (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. (දුරකථන අංකය : 2661866, 2661828 ගෙන් ලබාගත හැක.)

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනට ම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 56, මඩිහේ නාහිමි මාවත,
මහරගම.
දුරකථන අංක 0777-378441/0714 - 424478
ෆැක්ස් අංකය : 0112 - 509442.

01-759

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ වර්ෂ 2020ක් වූ පෙබරවාරි මස 18 වැනි දින පෙරවරු 11.30 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බොරලැස්ගමුව නගර සභා සීමාවේ සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැපිලියාන බස්නාහිර අංක 535 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පැපිලියාන ග්‍රාමයේ පිහිටි කොළඹ පාර වරිපනම් අංක 475 දරන ''මග්ගොනයාඹවට'' නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් සම්පාදිත 1989.11.08 සහ 12 දිනැති අංක 7193 දරන පිඹුරේ දක්වෙන ලොට් 4 A යනුවෙන් දක්වෙන ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි ගහකොළ ආදී සියලු දෙය වේ.

විශාලත්වය (අ. 0, රූ. 0, පර්. 20)

වන්නිආරච්චිගේ නිව්ටන් අමරදාස ෆොන්සේකා සහ මුණසිංහ කුමාරතුංග ආරච්චිගේ ප්‍රේමලතා ෆොන්සේකා යන අය බන්ධනදයින් ලෙස සහ මුණසිංහ කුමාරතුංග ආරච්චිගේ ප්‍රේමලතා ෆොන්සේකා උකස්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. අරලියා දයානන්ද විසින් ලියා සහතික කරන ලද 2016.09.21 දිනැති අංක 334 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2020 ජනවාරි මස 03 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රය ද, වර්ෂ 2019 දෙසැම්බර් මස 21 වැනි දිනැති දිවයින, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ඉහත කී දේපලට පිවිසෙන මාර්ගය.-* කොළඹ සිට හයිලෙවල් පාර ඔස්සේ කි. මී. 10.5ක් ගමන් කොට 4/2 බෝක්කුව පසුකළ විට දකුණු පස විෂයගත දේපළ පිහිටා ඇත. පැපිලියාන හන්දිය දක්වා දුර මීටර 300 කි.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක් ද, (සියයට දෙක හමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000).

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරිමුදල දින 30ක් ඇතුළත දි නොගෙව්වහොත් ගෙවා ඇති 10 % ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු සඳහා කළමනාකරු, ණය අය කර ගැනීම් අංශය, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය අංක 450, ගාලු පාර, කොළඹ 03.

පී. කේ. ඊ. සේනාපති,
බලයලත් වෙන්දේසිකරු,

අංක 134, බැද්දෙගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 011- 2873656, 0777672082.

01-760

## හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. - එරාවූර් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් ගමේ එරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය එරාවූර් පත්තු ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මිරකර්නි ග්‍රාම නිලධාරී වසම තුළ මිරකර්නි ගමේ මිරකර්නි පාරේ පිහිටි ඉඩමට බලයලත් මානක ඒ. එම්. නජුවුඩීන් විසින් 2017 පෙබරවාරි මස 11 වැනි දින මැන සාදන ලද අංක AMN/17/ඊපී/ 7499 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 නමැති බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : රූඩ් 01, පර්චස් 30.85 සහ එහි සියලුම සවි කරන ලද නිශ්චල යන්ත්‍රෝපකරණ යන්ත්‍ර සූත්‍ර සහ මෙවලම් ඇතුළු පහත විස්තර කර ඇති නිශ්චල දේපළ ද සමගින් වේ.

| *විස්තරය* | *වර්ගය හා මාදිලිය* | *ආරම්භක රට* |
|---|---|---|
| නිව් රයිස් කලර් සෝර්ටින් මැෂින් (යුනිට් 01) | 6R හයි ස්පීඩ් රියල් යටිම් අයිඩෙන්ටිෆිකේෂන් සිස්ටම් 6SXM378 | චීනය |
| ටැන්ක් (08) | - | - |
| එළිවේට් (2' x 1/2 x 26 (06) | - | - |
| කලර් සෝර්ට් කැබින් (01) | - | - |
| මෝටර් 3HP (06) | - | - |
| 1200C වෙයිට්බ්‍රිජ් ප්ලැට්ෆෝර්ම් (යුනිට් 01) | - | එක්සත් රාජධානිය |

මෙම දේපළ ඔරයිසා රයිස් එක්ස්පෝටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන අය බන්ධනදයී වශයෙන් හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - එරාවූර් නගරයේ ඔරලෝසු කණුව හන්දියේ සිට පුන්නයිකුඩා පාරේ මීටර් 800ක් පමණ ගමන් ගෙන දකුණට හැරී මිරකර්නි පාරට පිවිස මෙම පාර ඔස්සේ මීටර් 300ක් පමණ ගමන් ගත් පසු මෙම පාරට මායිම්ව වම් පසින් අදළ දේපළ පිහිටා ඇත.

**2020 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින ප. ව. 1.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

යෝජනා සම්මුති සඳහා 2018.11.16 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2018.11.28 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.,

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න ඃ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක ඃ 011 - 2661835, 011- 2661836, 011- 2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක ඃ 081-2210595/ 071-8446374/071-4962449.

01-754

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - එරාවූර් ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් ගමේ, එරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, එරාවූර් පත්තු ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මිරකර්නි ග්‍රාම නිලධාරී වසම, තුළ මිරකර්නි ගමේ මිරකර්නි පාරේ පිහිටි ඉඩමට බලයලත් මානක ඒ. එම්. නජුවුඩින් විසින් 2017.02.11 වැනි දින සාදන ලද අංක ඒ එම් එන්/17/ඊපී/7500 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 නමැති බෙද වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය ඃ රූඩ් 03 පර්චස් 20.60 සහ එහි සියලුම සවි කරන ලද නිශ්චල යන්ත්‍රෝපකරණ යන්ත්‍ර සූත්‍ර සහ මෙවලම් ඇතුළු පහත විස්තර කර ඇති නිශ්චල දේපළ ද සමගින් වේ.

සියලුම සවිකරන ලද නිශ්චල යන්ත්‍රෝපකරණ, යන්ත්‍රසූත්‍ර සහ මෙවලම් ඇතුළු උපකරණ වේ.

| *ඒකකය* | *විස්තරය* | *වර්ගය හා මාදිලිය* | *ආරම්භක රට* |
|---|---|---|---|
| 01 | ෆෝ ටොන් කැපැසිටි ස්ටීම් බොයිලර් | ෂෙල්මැක්ස්-තර්මැක්ස් ලිමිටඩ් සිරියල් අංක 1B-300-2 | ඉන්දියාව |
| 01 | පැඩ් ඩ්‍රයර් - 26000 Kg | | ඉන්දියාව |
| 01 | බර්නර් විත් 3.OHP මොටර්ස් | | ශ්‍රී ලංකාව |
| 01 | ප්‍රේෂර් පම්ප් විත් 5.0HP මෝටර්ස් | | ශ්‍රී ලංකාව |
| 02 | පැඩි කූලර් 2x220.000 | | ශ්‍රී ලංකාව |
| 01 | පැඩි බොයිලර් එළිවේටර් - 132 Ft | | ශ්‍රී ලංකාව |
| 06 | ෂ්ටීල් බොයිලර් ටැන්ක්ස් විත් 12 අවුට් ලට්ස් | | ශ්‍රී ලංකාව |
| 03 | ඩයිට් සිලෝස් 10ft. high 3x330,000 | | ශ්‍රී ලංකාව |
| 02 | පැඩි ක්ලිනර් විත් මෝටර්ස් 7.50 HP | | චීනය |

| ඒකකය | විස්තරය | වර්ගය හා මාදිලිය | ආරම්භක රට |
|---|---|---|---|
| 01 | පැඩි ක්ලිනර් සෙපරේටර් විත් 3.0HP | | ඉන්දියාව |
| 01 | රයිස් ඩ්‍රයර් විත් 5.0HP මෝටර්ස් | | ශ්‍රී ලංකාව |
| 01 | රයිස් ඩ්‍රයර් විත් 3.0HP මෝටර්ස් | | චීනය |
| 01 | රයිස් එළිවේටර් - 496 ft | | ශ්‍රී ලංකාව |
| 02 | පැනල් බොඩර්ස් 7x750,000 | | චීනය |
| 01 | CCD රයිස් කලර් සෝටර් 4R මැෂින් විත් ඔල් ඇක්සසරිස් | හේෆි තායි ඔප්ටෝ ඉලෙක්ට්‍රොනික් 65XM-252 | චීනය |
| 01 | පැඩි ස්ටෝනර් | DXCIN TQSX 120 | චීනය |
| 01 | සෙපරේටර් | DXCIN MGCz 100x10 | චීනය |
| 01 | රයිස් ග්‍රේඩර්ග් | DXCIN MMIP 80x3 | චීනය |
| 01 | පැඩි ක්ලීනර් | DXCIN TQLz 100x2 | චීනය |
| 01 | පැඩි ස්ටෝනර් | DXCIN TQS x100 | චීනය |
| 02 | රයිස් වයිට්නර් | DXCIN | චීනය |
| 02 | සිල්කි පොලිෂර් | DXCIN MPGH 19x1 | චීනය |
| 01 | පැඩි ඩ්‍රයර් විත් කැපැසිටි ඔෆ් 30,000 Kg | | |
| 01 | යුනිට් ඔෆ් කැෂු බොයිලින් ටැන්ක් | | |

මෙම දේපළ ඔරයිසා රයිස් එක්ස්පෝටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන අය බන්ධනදයි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - එරාවූර් නගරයේ ඔරලෝසු කණුව හන්දියේ සිට පුන්නයිකුඩා පාරේ මීටර් 800ක් පමණ ගමන් ගෙන දකුණට හැරී මිරරකර්නි පාරට පිවිස මෙම පාර ඔස්සේ මීටර් 300ක් පමණ ගමන් ගත් පසු වම් දෙසින් පිහිටි අඩි 20ක් පළල පාරට පිවිස එම පාරේ මීටර් 75ක් පමණ ගිය පසු පාරට මායිම්ව දකුණු පසින් අදළ දේපළ පිහිටා ඇත.

2020 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින ප. ව. 1.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.11.16 වැනි දින රජයේ *ගැසට්* පත්‍රය ද, 2018.11.28 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,

3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු ( අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 - 2661835, 011- 2661836, 011- 2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 081-2210595/071-8446374/071-4962449.

01-755